# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1765/7 - 2012 ජූලි මස 04 වැනි බදාදා - 2012.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3(2) වැනි උපවගන්තිය යටතේ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මම, ආයෝජන හා සංචාරක විෂය භාර අමාත්‍යවරයාද ලෙස මෙම නිවේදනය මගින් -

(1) සීමාසහිත වෙල්කොම්හොටෙල්ස් ලංකා පුද්ගලික සමාගම ("ව්‍යාපෘති සමාගම") හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට වර්ෂ 2012ක් වූ මැයි මස 04 වැනි දින එළඹෙන ලද බවත්, ඇමෙරිකානු ඩොලර් මිලියන එකසිය හතලිහ (ඇ. ඩො. 1,40,000,000) ක මුලු ආයෝජනයකින් යුත් සුඛෝපභෝගී හෝටලයක් ඇතුළුව මිශ්‍ර උපයෝගීතා සංකීර්ණයක් බස්නාහිර පළාතේ කොළඹ 01, කොටුවෙහි ඉදිකිරීමේ මෙම ව්‍යාපෘතිය රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙනු ලබන රටේ හුදර්ශනය වෙනස් වීමට ද තුඩුදිය හැකි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලැබේ.

(2) ඉහත කී ව්‍යාපෘතියට අදාලව වෙන්කර ඇති අක්කර 5යි, රූඩ් 3යි, පර්චස් 18.7ක භූමි භාගයකින් යුත් කොළඹ 01, කොටුවෙහි පිහිටි ඉඩම 2012 මැයි මස 4 වැනි දින බදු ගිවිසුමක් මගින් වසර අනූ නවය (99) කට බදු දෙන ලද බවත්, තවද ඉහත සඳහන් මුලු ආයෝජන මුදල වන ඇමෙරිකානු ඩොලර් මිලියන එකසිය හතලිහ (ඇ. ඩො. 1,40,000,000) ක් වන මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන හැත්තෑ තුනයි පන් ලක්ෂයක (ඇ. ඩො. 73,500,000) ක මුදලක් ව්‍යාපෘති සමාගම මගින් එකවර අයකර ගන්නා බදු වාරිකයක් ලෙස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ නාගරික සංවර්ධන අරමුදල් ගිණුමට බැර කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.

(3) ඉහත කී ව්‍යාපෘතිය 2012 මැයි මස 04 වැනි දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපෘති ගිවිසුමට එළඹුණු දිනය සිට ක්‍රියාත්මක වන අතර, එකී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ දෙනු ලබන සහනයන්/නිදහස් කිරීම් පාර්ලිමේන්තු යෝජනා සම්මතය අනුමත කිරීමේ දින සිට මාස හැට (60) ක කාලයක් තුළ ඇරඹිය යුතු බවත් ප්‍රකාශ කර සිටිමි.

(4) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව මෙහි උපලේඛණයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාල වන බවට ද නිශ්චිතව දක්වනු ලබමි.

1A - G 16264— 385 (2012/07)

**උපලේඛනය**

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

(i) වසර දහය (10)ක කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ (බදු නිදහස් කාලය). එකී වසර දහය (10) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01)ක කාල පරිච්ඡේදයක් සඳහා ලාභ වලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබේ.

(ii) එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම බදුමත ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුන (03) යන දෙකින් මුලින් එළඹෙන දින සිට ආරම්භ වේ.

(iii) ඉන්මතු බදු ඉහත (i) උප වගන්තියේ සඳහන් නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන ඉක්බිති වසර පහළොව (15) ක් ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායමින් සියයට හය (6%) ක ප්‍රතිශතයක් හෝ හෝටල් කර්මාන්තයට අදාල බදු අනුපාතයෙන් සියයට පනහ (50%) ක වන දෙකින් කවර හෝ අවම අනුපාතයකට අර්ධ නිදහස් කිරීමක් හිමි වේ. (සහනකාරී බදු කාලය).

(iv) ඉහත විදහා පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බල පැවැත්වෙන සාමාන්‍ය බදු රාමුව, ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම් මත ආදායම් බදු ගෙවීමට කෙරෙහි අදාළ වනු ඇත.

(v) සේවකයින් 20 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර පහ (5) ක කාලයක් සඳහා වලංගු වනු ඇත. ව්‍යාපෘති සමාගම ප්‍රවාසික සේවකයන් දේශීය සේවකයන් මඟින් ක්‍රමාත්මකව ප්‍රතිස්ථාපනය කිරීමට උපරිම උත්සාහ ගත යුතු ය.

(vi) පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගමට නිදහස ලැබෙන අතර ලැබුම්කරු දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු සියළුම ආදායම් බදු වලින් නිදහස් වේ.

(අ) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොළිය ;

(ආ) උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව.

(ඇ) දළ ආදායමින් 3% දක්වා කළමණාකරණ ගාස්තුව.

(ඈ) දළ ආදායමින් 1.5% දක්වා රාජ්‍ය භාග ගාස්තුව.

(ඉ) දළ ආදායමින් 1.5% දක්වා අලෙවිකරණ ගාස්තුව.

(ඊ) දළ මෙහෙයුම් ලාභයෙන් 10% දක්වා කළමනාකරණ දිරි දීමනා ගෙවීම්.

(උ) ITC සමාගම හෝ සමාගමේ සේවා සපයන්නන් විසින් මධ්‍යම සංචිත පද්ධතිය ("Central Reservation System") තුළින් කරන වෙන් කිරීම් සඳහා අයකිරීම්, ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන දිනට අදාල එකී වෙන් කිරීමක් සඳහා ඇමරිකානු ඩොලර් 5-6 පරාසයක පවතී.

(ආ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත (VAT)

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාල දේශීය වශයෙන් මිළදීගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු සහනය මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියට/ව්‍යාපෘති සමාගම වෙත සෘජුවම කරන සැපයුම් පමණක් නොව ව්‍යාපෘති සමාගම අනුමත කරන කොන්තරාත්කරුවකු වෙත උප කොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන සැපයුම් සඳහා ද අදාල වේ.

ව්‍යාපෘති සමාගම එකී වාණිජ කටයුතු ආරම්භ කිරීමත් සමගම එකතු කළ අගය මත බදු පනත අනුව VAT බදු ගෙවීමට යටතේ වේ.

(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් තුලින් කරනු ලබන ආනයනයන් සඳහා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් වලින් නිදහස් වේ.

(ඈ) 2005 අංක 05 දරන මුදල් පනත

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතිය සම්බන්ධව ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් අදාල වීමෙන් නිදහස් වේ.

(ඉ) (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාල සියලුම ආනයනයන් රේගු බදු අයකිරීම් තුලින් නිදහස් වේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා. ම.,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2012 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-499

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.